සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
Year End Evaluation

පිළිතුරු පත්‍රය
**Marking Scheme**

ශ්‍රේණිය / தரம் / Grade: 10
විෂයය / பாடம் / Subject: කතෝලික ධර්මය
පත්‍රය / வினாத்தாள் / Paper: I,II

## I පත්‍රය

| | | | |
|---|---|---|---|
| (1) 2 | (11) 2 | (21) 1 | (31) 4 |
| (2) 2 | (12) 3 | (22) 3 | (32) 4 |
| (3) 1 | (13) 4 | (23) 4 | (33) 4 |
| (4) 2 | (14) 4 | (24) 4 | (34) 3 |
| (5) 2 | (15) 3 | (25) 2 | (35) 2 |
| (6) 4 | (16) 3 | (26) 3 | (36) 4 |
| (7) 1 | (17) 1 | (27) 2 | (37) 4 |
| (8) 1 | (18) 2 | (28) 1 | (38) 4 |
| (9) 3 | (19) 4 | (29) 2 | (39) 4 |
| (10) 4 | (20) 4 | (30) 3 | (40) 2 |

(ලකුණු 1x40=40)

## II පත්‍රය

(01) (1) ජෝෂුවා, විනිශ්චයකාරයෝ, රූත් කථාව, 1 සාමුවෙල්, 2 සාමුවෙල්, 1 රාජාවලිය, 2 රාජාවලිය, 1 වංශාවලිය, 2 වංශාවලිය, එස්රා, නෙහෙමියා, තෝබිත්, ජුඩිත්, එස්තර්, 1 මකබි, 2 මකබි.

(ලකුණු 1x2=2)

(2) සිල්වෙස්ත්‍රෝ බෙනදිකාන නිකාය, ද ලාසාල් සොහොයුරන්ගේ පැවදි නිකාය, මාරිස්ට් සොහොයුරන්ගේ පැවදි නිකාය, ශු. පවුලේ කන්‍යා සොහොයුරියන්ගේ පැවදි නිකාය, යහපත් එඬේරා කන්‍යා සොහොයුරියන්ගේ පැවදි නිකාය, ෆ්‍රැන්සිස්කාන කන්‍යා සොහොයුරියන්ගේ පැවදි නිකාය, දිළිඳුන්ගේ කුඩා සොහොයුරියන්ගේ පැවදි නිකාය, නිර්මල මරිය නිකාය, ජේසු නිකාය. (ලකුණු 1x2=2)

(3) පශ්චාත්තාපය, බලාපොරොත්තුව (ලකුණු 2)

(4) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කිරීම, පූජකවරය ස්ථාපිත කිරීම, අපෝස්තුලුවරුන්ගේ පාද දෝවනය කිරීම, උත්තම පූජක යාච්ඤාව භාවිත කරමින් දෙවි පියාණන් වහන්සේට යාච්ඤා කිරීම. (ලකුණු 2)

(5)
- ඔවුන් වහන්සේව අතහැර පලායාම.
- උත්තම පූජකවරයාගේ දාසයා වූ මල්කුස්ගේ කණ කපාලීම.
- පේදුරු තුමා තෙවරක් ඔවුන් වහන්සේව නාඳුනන බව ප්‍රකාශ කිරීම.

(6) ◆ නොවැම්බර් 27 සිට දෙසැම්බර් 03 අතර පැමිණෙන ආගමන සමයේ පළමු ඉරුදින සිට දෙසැම්බර් 16 දක්වා කාලය තුළ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ දෙවන පැමිණීමට හෙවත් පරුසියාවට (parousia)සූදානම් වෙයි.

◆ දෙසැම්බර් 17 සිට 24 දක්වා කාලය තුල ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ඓතිහාසික ආගමනය හෙවත් පළමු පැමිණීම සැමරීමට සූදානම් වෙයි. (ලකුණු 2)

(7) සොරකම් කිරීම, වංචා සහගතව අන් අය සතු දේ ලබා ගැනීම, අන් අයගේ දේපළ විනාශ කිරීම, අනුන්ගේ කාලය නාස්ති කිරීම. (ලකුණු 1x2 = 2)

(8) ◆ දේව ස්වරූපය හා සමානකම අනුව මිනිසා ව මවා ඇත.

◆ ජීවන හුස්ම ලබා දී ඇත. (ලකුණු 2)

(9) ◆ ශුද්ධ වූ සභාව ක්‍රිස්තුස් වහන්සේ විසින් ස්ථාපිත කර ඇත.

◆ ශුද්ධ වූ සභාව ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් මෙහෙයවන සේක.

◆ ශුද්ධ වූ සභාව දෙවියන් වහන්සේ විසින් තෝරා ගත් ජනතාවකි. (ලකුණු 1x2=2)

(10) පාලකයින්ට ගරු කිරීම හා අවනත වීම, තම හෘදය සාක්ෂියට අනුව ඡන්දය භාවිත කිරීම, නියමිත ලෙස බදු ගෙවීම, පාලකයින් වෙනුවෙන් යාච්ඤා කිරීම. (ලකුණු 1x2=2)

(02) (1) දේව වාක්‍යය පිළිවෙත, ස්තෝත්‍ර යාගික පිළිවෙත (ලකුණු 2)

(2) ◆ ගරු මයිකල් රුද්‍රිගු (නි.ම.නි) පියතුමා. (ලකුණු 1)

◆ පූජක දිවිය - සේවක පූජකත්වය ගෙන යාමට.

◆ ආර්ථික හා සමාජීයීය වශයෙන් දිළිඳු ජනතාවගේ ගැටලුවලට විසඳුම් සෙවීම.

◆ තරුණ ප්‍රශ්න වෙනුවෙන් ඉදිරිපත් වීම.

◆ බෞද්ධ හා කිතුනු ආගම් අතර සුහදතාව හා සහයෝගිතාව ගොඩනැංවීම.

◆ ජනවන්දනාව දේශීයකරණය කිරීම.

◆ සාධාරණත්වය මත පදනම් වූ සමාජයක් බිහි කිරීම (ලකුණු 1x2=2)

(3) ◆ දිව්‍ය පූජාව මගින් දෙවියන්වහන්සේට නමස්කාර කිරීම, තුති පිදීම, පාපයනට වන්දි ගෙවීම සිදු කළ හැකි බව ප්‍රකාශ කිරීම.

◆ දිව්‍ය පූජාවට සහභාගි වීම තුළ ක්‍රිස්තුස් වහන්සේගේ දුක්ප්‍රාප්තිය, මරණය හා උත්ථානය මෙනෙහි කළ හැකි බව ප්‍රකාශ කිරීම.

◆ දිව්‍ය පූජාවට සහභාගි වීම තුළ මීසම් පවුලක් ලෙස අපට ජේසු සමිඳුන් තුළ එකමුතු විය හැකි බව ප්‍රකාශ කිරීම.

◆ දිව්‍ය පූජාව ජීවතුන් හා මළා වූ අය වෙනුවෙන් පිදිය හැකි බව ප්‍රකාශ කිරීම.

◆ දිව්‍ය පූජාවට සහභාගි වීම තුළ ක්‍රිස්තුස් වහන්සේගේ ඉගැන්වීම් ජීවත් කරලීමට අවශ්‍ය වරප්‍රසාද ලැබෙන බව ප්‍රකාශ කිරීම.

ඉහත කරුණුවලට සමාන පිළිතුරු ඇතොත් ලකුණු ලබාදෙන්න. (ලකුණු 1x5=5)

(3) ◆ ශුද්ධ බයිබලයේ චරිත වලින් ප්‍රකාශ වන කිතුනු ගුණාංග අප ජීවිත ආදර්ශයට ගත හැකි වීම.

◆ ශුද්ධ බයිබලයෙන් ප්‍රකාශ වන දෙවියන් වහන්සේගේ ආදරයට ප්‍රතිප්‍රේම දැක්වීමේ ආදර්ශය අපට ලබාගත හැකි වීම.

◆ ශුද්ධ බයිබලය අධ්‍යනයෙන් ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳ නිවැරදි මත ගොඩනගා ගැනීමේ ආදර්ශය ශුද්ධ බයිබයලයෙන් අපට ලබා ගත හැකි වීම.

◆ ශුද්ධ බයිබලය අධ්‍යයනයෙන් ක්‍රිස්තුස් වහන්සේගේ ඉගැන්වීම් අප ජීවිතය තුළ ගොඩනගා ගැනීමේ ආදර්ශය ශුද්ධ බයිබලයෙන් අපට ලබා ගත හැකිය.

◆ ශුද්ධ බයිබලය අධ්‍යනයෙන් මුල් කිතුනුවන්ගේ ජීවිත ආදර්ශය අප ජීවිතයට ආදර්ශයක් කර ගත හැකිය.

ඉහත කරුනුවලට සමාන පිළිතුරු ඇතොත් ලකුණු ලබාදෙන්න. (ලකුණු 5)

(04) (1) දිව්‍ය පූජාව පැවැත්වීම තහනම් කිරීම, කතෝලික දෙව්මැඳුර, පාසල් හ පුණ්‍ය ආයතන රෙපරමාදු පූජකයන්ට පැවරීම, කතෝලික පියවරුන් රටින් පිටුවහල් කිරීම. ( ල කු ණු 1x2=2)

(2) වෙස්වළාගෙන ධර්මදූත කටයුතුවල නියුක්ත වීම, ගිහි නායකයින් කතෝලික සභාවල ක්‍රියාකාරී පුද්ගලයන් බවට පත් කිරීම, තම චාම් ජීවිතය මඟින් ශ්‍රී ලාංකික කිතුනුවන්ට ආදර්ශමත් වීම (ලකුණු 3)

(3) ◆ ජුසේවාස් මුනිඳුන් යාච්ඤාවේ ජීවිතයක් ගත කල ලෙස වර්තමාන ධර්මදූතවරුද යාච්ඤා ජීවිතයක ආදර්ශය ශු. ජුසේවාස් මුනිඳුන්ගෙන් ලබාගත හැකි වීම.

◆ ශුද්ධ වූ ජුසේවාස් මුනිඳුන් මෙන් වර්තමාන ධර්මදූතවරුන්ද විවිධ භාෂා පිළිබඳ දැනුමක් ලබාගැනීමේ ආදර්ශය ශුද්ධ වූ ජුසේවාස් මුනිඳුන්ගෙන් ලබාගත හැකිය.

◆ ජුසේවාස් පියතුමා වසූරිය රෝගීන්ට උපස්ථාන කල පරිදි වර්තමාන ධර්මදූතවරුද ගිහියාගේ අවශ්‍යතාවයන් වලට සංවේදී විය යුතුය, යන ආදර්ශය ලබාගත හැකිය.

◆ ශුද්ධ වූ ජුසේවාස් මුනිඳුන් දේශීය සංස්කෘතිය අගය කළාසේ වර්තමාන ධර්මදූතවරුද දේශිය සංස්කෘතිය අගය කරමින් තම ධර්මදූත කාර්‍යය කිරීමේ ආදර්ශය ජුසේවාස් මුනිඳුන්ගෙන් ලබාගත හැකිය.

◆ හිස්පතුලෙන් ධර්මදූත ගමන්වල නියැලුණු ශුද්ධ වූ ජුසේවාස් පියතුමන් මෙන් වර්තමාන ධර්මදූතවරුද කැපවූ සේවාවක් කිරීමට ශුද්ධ වූ ජුසේවාස් මුනිඳුන්ගේ ආදර්ශය ලබාගත යුතුය.

ඉහත කරුණුවලට සමාන පිළිතුරු ඇතොත් ලකුණු ලබාදෙන්න. (ලකුණු 5)

(05) (1) ශුද්ධ වූ ජොහන් සුභාරංචිය (ලකුණු 2)

(2) ◆ තමන් වහන්සේ වෙනුවෙන් යාච්ඤා කිරීම.

◆ ශ්‍රාවකයන් වෙනුවෙන් යාච්ඤා කිරීම.

◆ අනාගත සභාවේ එකමුතුව වෙනුවෙන් යාච්ඤා කිරීම. (ලකුණු 3)

(3) ◆ භක්තියෙන් යුතුව යාච්ඤා මෙහෙයන්වලට සහභාගි වීම.

◆ යාච්ඤා, කියවීම්, ගීතිකාවලට භක්තිමත්ව දායක වීම.

◆ මනස්තාපී හදවතකින් යුතුව යාච්ඤා කිරීමට එකතු වීම.

සහය වීම.

◆යාච්ඤා මෙහෙයන්වලට ආරම්භයේ සිට අවසානය දක්වා අර්ථාන්විතව සහභාගි වීම.

ඉහත කරුණුවලට සමාන පිළිතුරු ඇත්නම් ලකුණු ලබාදෙන්න (ලකුණු 5)

(06) (1) රෝම, 1 කොරින්ති, 2 කොරින්ති, පිලෙමොන්, ගලාති, පිලිප්පි, 1 තෙසලෝනික

(ලකුණු 1x2=2)

(2) ලංකා සභාව, මෙතෝදිස්ත සභාව, බැප්ටිස්ට් සභාව, ඕලන්ද රෙපරමාදු සභාව, ප්‍රෙස්බිටේරියන් සභාව, දකුණු ඉන්දියානු සභාව, ග්‍රීක ඕතඩොක්ස් සභාව

(ලකුණු 1x3=3)

(3) අභියෝග තුළ නොසැළී ඉදිරියට යාම, හැකි උපරිමයෙන් සේවය සඳහා කැපවීම, නොබියව ක්‍රිස්තුස් වහන්සේට සාක්ෂි දැරීම, ක්‍රිස්තුස් වහන්සේව අන් අයට හඳුන්වා දිම, දෙවිඳුන් කෙරෙහි ස්ථිර විශ්වාසයෙන් කටයුතු කිරීම. (ලකුණු 1x5=5)

(07) පහත මාතෘකා අතරින් දෙකකට කෙටි සටහන් ලියන්න.

(1) අටවන දේව පනත (පිටු - 100-103)

(2) ශුද්ධ වූ දෙවන ජුවාම් පාවුලු මුනිතුමා (පිටු - 58, 59)

(3) ගෞරවනීය ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමා (පිටු - 41)

(4) ශුද්ධ වූ පාවුලු තුමා (පිටු 26 - 29)

(ලකුණු 10)

10 ශ්‍රේණියේ කතෝලික ධර්මය පෙළපොතට අනුව කරුණු ඉදිරිපත් කර ඇත්නම් ලකුණු ලබාදෙන්න.

(කෙටි සටහන් දෙකකට ලකුණු 5 + 5 = 10)